

ප්‍රාථමික ශ්‍රේණි සිසු ගුරු අත්වැල

ශිෂ්‍යත්වයට පෙර සූදානමක්

සැකසුම - ජේ.ඒ. ජානකී ජයසිංහ

1 ශ්‍රේණියේ සිට 5 ශ්‍රේණිය දක්වා විෂය නිර්දේශයෙහි ඇතුළත් ,

- සමාන පද (5 ශ්‍රේණියේ සිංහල පෙළපොතේ සමාන පද ද ඇතුළත් ව)
- විරුද්ධ පද
- යුගල පද
- ප්‍රස්ථාව පිරුළු
- රූඪි/ඉඟි වැකි
- ආප්තෝපදේශ
- තේරවිලි
- ඒක වචන බහු වචන
- ස්ත්‍රී ලිංග හා පුරුෂ ලිංග වචන
- රචනා මාතෘකා හා 5 ශ්‍රේණිය සිංහල පෙළපොතෙහි අරුත් පැහැදිලි කිරීම්

ඇසුරින් සකසා ඇත.

## සමාන පද

| | | |
|---|---|---|
| ගස = රුක | සියපත් = නෙලුම් මල් | පොළොව = පෘථිවිය |
| තාත්තා = පියා | ප්‍රකට = ප්‍රසිද්ධ | අතීතයේ = පුරාණයේ |
| පාසල = විදුහල | කෙත = කුඹුර | දුර්ලභ = විරල |
| තරු = තාරකා | සූර්යයා = ඉර | දිනිසුරු = හිරු |
| දූපත = දිවයින | කම්මැළි = කුසීතකම | තරුපති = චන්ද්‍රයා |
| අහස = ගුවන | ඥානය = නුවණ | උදෑසන = හිමිදිරිය |
| ඉර = හිරු | ප්‍රීතිය = සතුට | කුරුල්ලා = පක්ෂියා |
| ඔළුව = හිස | පියා = තාත්තා | පාදය = කකුල |
| ප්‍රවෘත්තිය = පුවත | පුංචි = පොඩි | වතුර = ජලය |
| රාත්‍රිය = රැය | ලොවේ = ලෝකයෙ | පොත = ග්‍රන්ථය |
| අම්මා = මව | එකමුතුකම = එකතුවෙලා | අවුරුද්ද = වසර |
| ගෙදර = නිවස | ග්‍රන්ථය = පොත | කටින් = මුවෙන් |
| පාර = මාර්ගය | සයුරේ = මුහුදේ | ශබ්දය = හඬ |
| කැලෑව = වනය | අර්ථය = තේරුම | වතුර = දිය |
| ඇස් = නෙත් | මහන්සිය = වෙහෙස | |
| | | |

## විරුද්ධ පද

| | | |
|---|---|---|
| උඩ = යට | ගැළපෙන = නොගැළපෙන | කීකරු = අකීකරු |
| උස = මිටි | ලොකු = පොඩි | සෙමෙන් = වේගයෙන් |
| ඉදිරිපස = පිටුපස | කැමති = අකමැති | මහතයි = කෙට්ටුයි |
| ඉහළ = පහළ | පිපෙනවා = පරවෙනවා | යනවා = එනවා |

| | | |
|---|---|---|
| පිරිසිදු = අපිරිසිදු | දිරන = නොදිරන | පුහුණු = නුපුහුණු |
| ප්‍රශ්න = පිළිතුරු | සුදුසු = නොසුදුසු | වැරදි = නිවැරදි |
| පුරුදු = නුපුරුදු | ලස්සන = අවලස්සන | අලුත් = පරණ |
| යහපත් = අයහපත් | පැමිණීම = නොපැමිණීම | |
| ආරම්භය = අවසානය | අවශ්‍ය = අනවශ්‍ය | |
| | | |
| **යුගල පද** | | |
| ගමන් බිමන් | පොත් පත් | අනම් මනම් |
| අහල පහල | ගෙවල් දොරවල් | විහිළු තහළු |
| සිරිත් විරිත් | යාන වාහන | වාද විවාද |
| තෑගි බෝග | වතු පිටි | අරුම පුදුම |
| කෑම බීම | කෙළි සෙල්ලම් | අස්සක් මුල්ලක් |
| | | |
| **ප්‍රස්තාව පිරුළු** | | |
| පරංගියා කෝට්ටේ ගියා වගේ - කිට්ටු පාරක් තිබ්ය දී දුර පාරකින් යෑම | | |
| මඬේ හිටවපු ඉන්න වගේ - එක තීරණයක නොසිටීම | | |
| ඉබ්බාගෙන් පිහාටු ඉල්ලනවා වගේ - කෙනෙකුගෙන් කෙසේ වත් ලබාගත නොහැකි දෙයක් ලබා ගැනීමට උත්සාහ දැරීම | | |
| ඉදිකටුවයි නූලයි වගේ - සැමවිටම තමන් සමග තවත් අයෙක් එකට සිටීම | | |
| ළිඳේ ඉන්න ගෙම්බා වගේ - තමා අවට සමාජය පිළිබඳ අවබෝධයක් නොමැති | | |
| ඉඟුරු දී මිරිස් ගත්තා වගේ - යම් අපහසුතාවකින් හෝ කරදරයකින් හෝ මිදීමට කරන ක්‍රියාවෙන් වඩාත් කරදරයකට හා අපහසුතාවට පත් වීම | | |

ප්‍රාථමික ශ්‍රේණි සිසු ගුරු අත්වැල
ශිෂ්‍යත්වයට පෙර සූදානමක්
ජානකී ජයසිංහ

| |
|---|
| ආඬි හත්දෙනාගේ කැඳ හැළිය වගේ - අනුන් රවටන්නට ගොස් තමන් රැවටීම |
| කළුවා මාරපන් ගියා වගේ - විමසීමකින් තොර ව යමක් කිරීම |
| කටුස්සාගේ කරේ රත්තරන් බැන්දා වගේ - නුසුදුස්සාට තනතුරු/වරප්‍රසාද දීමෙන් අහංකාර වීම |
| කැකිල්ලේ රජ්ජුරුවන්ගේ නඩු තීන්දුව වගේ - තීරණ ගැනීමේ දී බුද්ධිමත් ලෙස කටයුතු නොකර නුසුදුසු තීරණ ගැනීම. |
| ඇවිළෙන ගින්නට පිදුරු දානවා වගේ - |
| ගඟට ඉනි කැපුවා වගේ - දුක් මහන්සියෙන් කළ වැඩක ප්‍රතිඵලයක් නොලැබීම |
| රයිගමයයි ගම්පළයයි වගේ - ගැළපෙන අදහස් හා ගතිගුණ තිබීම |
| නරියා මිදි තිත්තයි කිවුවා වගේ - යමක් කිරීමට උත්සාහ කර එය කර ගත නොහැකි විට එහි අගුණ කීම |
| කට නිසා ඉබ්බා නැහුණා වගේ - සුදුසු නොසුදුසු දේ විචාර බුද්ධියෙන් නොවිමසා කතා කිරීම |
| මහදැනමුත්තාගේ නුවණ වගේ - අදූරදර්ශී උපදෙස් |

| | | |
|---|---|---|
| | | |

| රූඩී/ඉඟි වැකි |
|---|
| එක හුස්මට - යම් කිසි කාර්යයක් අවසන් වන තුරු නොනවත්වා කිරීම යි. |
| අකුරක් නෑර - කිසිවක් අත නොහැර කියවීම සහ කතා කිරීම යි. |
| ඉහේ මලක් පිපුණා - දැඩි සතුටකට පත්වීම යි. |
| අනූ නවයෙන් බේරුණා - යම් විපතකින් යාන්තමින් ගැළවීම යි. |
| මොරසූරන වැස්ස - අධික වර්ෂාව යි. |
| ඇඟ බේරා ගන්නවා - වගකීමෙන් බේරීම |
| හීන් දාඩිය දැම්මා - දැඩි සේ බියට පත් වීම |
| අහසේ මාලිගා තනනවා - ඉටු නොවන සිහින මැවීම |

| |
|---|
| අබමල් රේණුවක් - ඉතා ම කුඩා ප්‍රමාණයක් |
| මුරුංගා අත්තේ තියනවා - රවටනු පිණිස වර්ණනා කිරීම |
| **ආප්තෝපදේශ** |
| අද කළ යුතු දේ හෙටට කල් නොදමන්න. - අද කළ යුතු දේ අද ම කරන්න. හෙටට කල් නොදමන්න. |
| ඇඟිල්ලේ තරමට ඉදිමෙන්න - ප්‍රමාණයට වඩා අහංකාර නොවන්න. |
| පනින්න පෙර සිතා බලනු - යමක් කිරීමට පෙර සිතා බලන්න. |
| ඇවිළෙන ගින්නට පිදුරු නොදමන්න - ආරවුලක් තව තවත් ඇවිස්සීමට කටයුතු නොකරන්න. |
| උගත මනා ශිල්පය ම යි මතු රැකෙනා - උගත් ශිල්පය ම මතු ආරක්ෂාව සලසයි. |

## තේරවිලි

තපස් රකිනවා
කෙතේ ඉන්නවා
මාළු සොයනවා
කියන්න මගේ නම - කොකා

උඩහ ගෙදර මම යනකොට
අඟුර දඟුර වැලක් තිබුණා
මල් සුවඳයි ගෙඩි තිත්තයි
නොතේරුවොත් ටොකු විස්සයි - කරවිල

ගුලක් බලා රිංගනවා
ඒක ඇතුළෙ කැරකෙනවා
ගේ දොර දොර බඩු රැක දෙනවා
තේරුවොතින් පඩි දෙනවා - යතුර

පිරිසිදුකම කරන අගේ
රැවුළ ඉත්තෑ කූරු වගේ
මිදුල වටේ යන එන කොට
රැවුළ ඇදෙයි පොළොව දිගේ - ඉදල

ගොහුරු වේල්ල - ගොහුරු නම් මඩ
වේල්ල නම් කණ්ඩිය
මඩ කණ්ඩිය - කඩමණ්ඩිය

දත් තිබුනත් කටක් නැතේ
සියලු ම දත් උල්ව ඇතේ
අවුල් ලිහා හැඩ කරතේ
නැති ගෙදරක් ඇත්තේ නැතේ - පනාව

ටිං ටිං ගාන්නා තෝරා එවාපන්
ටං ටං ගාන්නා තෝරා එවාපන්
මඟ වැලි පිසින්නා තෝරා එවාපන්
දෙගම්බඩ රජා තෝරා එවාපන්

ටිං ටිං ගාන්නා ලේනා නොවේ දෝ
ටං ටං ගාන්නා ගෝණා නොවේ දෝ
මඟ වැලි පිසින්නා කුකුළා නොවේ දෝ
දෙගම්බඩ රජා කිඹුලා නොවේ දෝ

ඉණේ තිබෙන ලිය තෝරා එවාපන්
ගෙදර තිබෙන ලිය තෝරා එවාපන්
ගසේ තිබෙන ලිය තෝරා එවාපන්
අතු අග තිබෙන ලිය තෝරා එවාපන්

ඉණේ තිබෙන ලිය හැඹිලිය නොවේ දෝ
ගෙදර තිබෙන ලිය ඇතිලිය නොවේ දෝ
ගසේ තිබෙන ලිය හෙරලිය නොවේ දෝ
අතු අග තිබෙන ලිය අරලිය නොවේ දෝ

නූල් බැඳි අහස් යානාව - සරුංගලය

ගජනාලය - ගජ නම් ඇත්
නාලය නම් බටය
ඇත් බටය - බත් ඇටය

හෙන දළ - හෙන නම් අකුණු
දළ නම් දත
අකුණු දත - දකුණු අත

චන්දි මුදල - චන්දි නම් දඩ
මුදල නම් කාසි
දඩ කාසි - කඩදාසි

ගසක නොපිපෙන මල - බිම්මල

ප්‍රාථමික ශ්‍රේණි සිසු ගුරු අත්වැල
ශිෂ්‍යත්වයට පෙර සූදානමක්
සැකසුම - ජේ.ඒ. ජානකී ජයසිංහ

මිනිසෙක් කොටියෙකු, එළුවෙකු සහ තම්පළා මිටියකුත් රැගෙන ගඟකින් එතෙර වීමට ගියා. වරකට ඔරුවෙන් එගොඩ විය හැක්කේ දෙදෙනෙකුට යි. මිනිසා මුලින් කොටියා රැගෙන ගියහොත් එළුවා තම්පළා මිටිය කනවා. මුලින් තම්පළා මිටිය ගෙන ගියහොත් කොටියා එළුවා ව කනවා. කෙසේ හෝ ගැටලුවක් නොමැති ව එගොඩ වීම සිදු වුණා. ඒ කෙසේ ද ?

ප්‍රාථමික ශ්‍රේණි සිසු ගුරු අත්වැල
ශිෂ්‍යත්වයට පෙර සූදානමක්
සැකසුම - ජේ.ඒ. ජානකී ජයසිංහ

පළමුවෙන් එළුවා රැගෙන එගොඩට යනවා. ඊළඟට තම්පලා මිටිය රැගෙන එගොඩට ගොස් තම්පලා මිටිය තබා එළුවා රැගෙන මෙගොඩට එනවා. එළුවා මෙගොඩ තබා කොටියා රැගෙන යනවා. ආපසු මෙගොඩට ඇවිත් එළුවා රැගෙන යනවා.

සත් සමුදුරේ දිය පල්ලේ උපන් නේ
එම සමුදුරේ දිය මතුපිට පිපෙන් නේ
වැස්සට පිනි බබා නිතර ම මෝරන් නේ
අද බැරි නම් හෙට තෝරා එවන් නේ

සත් සමුදුරේ දිය පල්ලේ තිබෙයි අල
එම සමුදුරේ දිය මතුපිට තිබෙයි කොළ
වැස්සට පිනි බබා මෝරන කැකුළු මල
මස්ටකයන්ට මුතු කුඩයකි නෙලුම් මල

පහත දැක්වෙන රචනා මාතෘකා සඳහා උක්ත ආඛ්‍යාතය නිවැරදි ව සහිතව වැකි පහ බැගින් ලියන්න.

1. මම ගසක් වෙමි.
2. මම සුළඟක් වෙමි.
3. මම මීමැස්සෙක් වෙමි.
4. මම ගුරුවරියක්/ගුරුවරයෙක් වෙමි.
5. මම පෑනක් වෙමි.
6. අපේ අවුරුදු ජන ක්‍රීඩා.
7. පරිසරයට ආදරය කරමු.
8. මම සූර්යයා වෙමි.
9. මාර්ටින් වික්‍රමසිංහ මහතා.
10. උදෑසනක අසිරිය.
11. රෝගීන්ට උපකාර කිරීමේ වැදගත්කම.
12. උගත මනා ශිල්පයමයි මතු රැකෙනා.
13. මා රෝගියෙකුට උපකාර කළ අවස්ථාවක්.
14. ශ්‍රී ලංකාව සුන්දර රටකි.
15. ඔබ මින් පෙර නොගිය අලුත් රටකට නෞකාවකින් ගමන් කරමින් සිටින්නේ යැයි සිතන්න. ඈතින් ක්‍රමයෙන් එම රට ඔබට දිස් වෙයි. ඒ අවස්ථාවේ දී ඔබට ඒ රට පිළිබඳ දැනෙන හැඟීම් විස්තර කරන්න.

ප්‍රාථමික ශ්‍රේණි සිසු ගුරු අත්වැල
ශිෂ්‍යත්වයට පෙර සූදානමක්
සැකසුම - ජේ.ඒ. ජානකී ජයසිංහ

## අරුත් පැහැදිලි කිරීම්

1) අබිමුවට - ඉදිරියට
2) දෛනික - දිනපතා සිදු කරන
3) ස්වේච්ඡාවෙන් - තමන්ගේ කැමැත්ත අනුව
4) නොහික්මුණු - හික්මීමක් නැති/ විනයක් නැත
5) අභ්‍යවකාශ මධ්‍යස්ථානය - පෘථිවියේ වායුගෝලයෙන් බැහැර රඳවා ඇති, උඩු ගුවන හා ග්‍රහ වස්තු ආදිය පිළිබඳ පර්යේෂණ කරන ස්ථානය
6) ස්කැන්ඩිනේවියානු රටවල් - ඩෙන්මාර්කය, නෝර්වේ, ස්වීඩනය, පින්ලන්තය, අයිස්ලන්තය
7) පරිපථය - යම්කිසි නිශ්චිත කාර්යයක් ඉටු කරවනු පිණිස සියුම් විද්‍යුත් උපාංග පෙළගස්වන ලද පද්ධතිය
8) එකිනෙකින් ස්වාධීනව - තවත් දෙයකින් පාලනය නොවන
9) කලල් කර ගන්ඩ - මඩ කර ගන්න
10) පැළපත - පැළ ගොයම

11) බණ්ඩි ඇදී - පිදී ගෙන එන/ බඩක් මෙන් මතු පිටට හෝ ඉදිරියට නෙරූ
12) වක්කඩ - කුඹුරක වැඩි ජලය බැස යාමට නියරෙහි කපන කපොල්ල
13) ඔමරි පාන - අඟර දඟර පෑම/ඉඟි බිඟි පෑම/උසුළු විසුළු පෑම
14) යලට මහට - ශ්‍රී ලංකාවේ ගොවිතැන් කරන ප්‍රධාන කාල පරිච්ඡේද දෙක - යල කන්නය හා මහ කන්නය
15) ගිරි ශිඛර - කඳු මුදුන්
16) ස්මරණය - මතකය
17) ඓතිහාසික - ඉතිහාසයට අයත්
18) සමුදාය - සමූහය/ රාශිය
19) සදාකාලික - හැම කාලයට ම අයත
20) සතය - රුපියලකින් සීයෙන් එකක වටිනාකම ඇති කාසිය.
21) පංක්තියේ - පන්තියේ
22) සමර්ථ - සමත්/ දක්ෂ
23) රථ - වාහන
24) පඬුරු - තෑගි
25) කවුළුයෙන් - කවුළුවෙන්/ ජනේලයෙන්
26) බෙහෙදක් - බෙහෙතක්
27) පිළියම් - ප්‍රතිකර්ම/ ප්‍රතිකාර
28) නුනුවණකමෙක් - මෝඩකමක්
29) සයංජාත රත් හැල් ඉබේ හට ගත් (ස්වයංජාත) රතු පැහැති ඇල් වී වර්ගයක්
30) දෝනාව - පතල්වල උමඟ හාරන ඉල්ලම් මඟ/පොළොව යට හාරන උමඟ
31) බඹ - බඹය යනු දිග මැනීමේ පැරණි මිනුමකි. අඩි හයේ දිග ප්‍රමාණය
32) සුදම් දිව්‍ය පුරයක් - ශක්‍ර දෙවියන් වාසය කරන දිව්‍ය ලෝකය
33) නේවාසික - වාසය කරන
34) ආචාර්ය භාගය - ගුරුතුමාට ගෙවන ගාස්තුව
35) ඇදුරුතුමා - ගුරුතුමා
36) නිෂ්ඵල - ප්‍රයෝජනයක් නැති
37) කෘතඥතාව - කළ උපකාරය උසස් කොට සැලකීම
38) ශීර්ෂාබාධය - හිසේ ආබාධය
39) ව්‍යාධිය - රෝගය
40) ඖෂධ - බෙහෙත්
41) ශාස්ත්‍රය - විෂය/ ශිල්පය
42) සිප්පිය - යාත්‍රා කඳ
43) බරාඳය - නැවක ඉදිරි කොටස/ආලින්දය/ ඉස්තෝප්පුව
44) වික්‍රමාන්විත - ශූර වූ/ බල පරාක්‍රමයෙන් යුතු

ප්‍රාථමික ශ්‍රේණි සිසු ගුරු අත්වැල
ශිෂ්‍යත්වයට පෙර සූදානමක්
සැකසුම - ජේ.ඒ. ජානකී ජයසිංහ

| ස්ත්‍රී ලිංග | පුරුෂ ලිංග |
|---|---|
| අම්මා | තාත්තා |
| ආච්චී | සීයා |
| ගිරවී | ගිරවා |
| පූසී | පූසා |
| කිරිල්ලී | කුරුල්ලා |
| කිකිළි | කුකුළා |
| දුව | පුතා |
| ගුරුතුමිය | ගුරුතුමා |
| වෛද්‍යවරිය | වෛද්‍යවරයා |
| විදුහල්පතිතුමිය | විදුහල්පතිතුමා |
| ශිෂ්‍යාව | ශිෂ්‍යයා |
| මුව දෙන | මුවා |
| සිංහධේනුව | සිංහයා |
| මිතුරිය | මිතුරා |
| රැජින | රජ |
| යෙහෙළිය | යහළුවා |
| නිළිය | නළුවා |
| ඇතින්න | ඇතා |
| කොටි දෙන | කොටියා |
| සහෝදරිය | සහෝදරයා |
| ලේඛිකාව | ලේඛකයා |
| කිවිඳිය | කවියා |
| ගෙවිලිය | ගොවියා |
| ඇය | ඔහු |
| දැරිය | දරුවා |

| ඒක වචන | බහු වචන |
|---|---|
| ගස | ගස් |
| මල | මල් |
| ගල | ගල් |
| අම්මා | අම්මලා |
| තාත්තා | තාත්තලා |
| කුරුල්ලා | කුරුල්ලො |
| උදැල්ල | උදලු |
| ගොවියා | ගොවියෝ |
| බල්ලා | බල්ලෝ |
| ගවයා | ගවයෝ |
| පොත | පොත් |
| කුඹුර | කුඹුරු |
| ළමයා | ළමයි |
| ශිෂ්‍යයා | ශිෂ්‍යයෝ |
| මම | අපි |
| පේළිය | පේළි |
| කණ්ඩායම | කණ්ඩායම් |
| ගුරුවරයා | ගුරුවරු |
| රට | රටවල් |
| ලේඛකයා | ලේඛකයෝ |
| සපත්තුව | සපත්තු |
| පොකුර | පොකුරු |
| කාමරය | කාමර |
| දොර | දොරවල් |
| නැව | නැව් |

ප්‍රාථමික ශ්‍රේණි සඳහා ගුරු අත්වැල
ශිෂ්‍යත්ව ... සූදානමක්
සැකසුම - ජේ. ඒ. ජානකී ජයසිංහ

| ඒක වචන | බහු වචන | ඒක වචන | බහු වචන |
|---|---|---|---|
| ජනාධිපති | ජනාධිපතිවරු | නළුවා | නළුවෝ |
| දේශකයා | දේශකයෝ | ශිෂ්‍යාව | ශිෂ්‍යාවෝ |
| තරුණයා | තරුණයෝ | කම්කරුවා | කම්කරුවෝ |
| ධීවරයා | ධීවරයෝ | මොනරා | මොනරු |
| රිළවා | රිළවු | මව | මව්වරු |
| පියා | පියවරු | අශ්වයා | අශ්වයෝ |
| ඔටුවා | ඔටුවෝ | මුවා | මුවෝ |

ප්‍රාථමික ගුරු අත්වැ
ශිෂ්‍යත්වයට පෙර සූදානමක්
සැකසුම - ජේ.ඒ. ජානකී ජයසිංහ

## රචනා මාතෘකා

1) මගේ අනාගත බලාපොරොත්තුව
2) පොල් ගස
3) පොදු දේපළ සුරකිමු
4) පොත් පත් කියවමු
5) අපේ ගෙවත්ත
6) අපි වර්ධනය කර ගත යුතු හොඳ පුරුදු
7) පොත් කියවීමේ අගය
8) යහපත් මිතුරන් ඇසුරු කිරීමේ අගය
9) කාලයේ වටිනාකම
10) මගේ රට
11) ජලය අපට සම්පතකි
12) මා කැමති ම ක්‍රීඩාව
13) මුහුදු වෙරළ
14) වැස්ස
15) රාත්‍රී අහස
16) කඳුකරය